(65)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් (ලිතෝ මුද්‍රණ ශිල්පීන්) II "අ" පන්තියේ සිට I පන්තියට උසස් කිරීමේ විභාගය - 2012

ලිතෝ මුද්‍රණ ශිල්පය I

2012.08.25 කාලය පැය තුන (03) යි 0900-1200 පැය

ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

01. අ) කඩදාසියක ග්‍රේන් දිශාව යනු කුමක්ද?

ආ) මුද්‍රණ ශිල්පියාට ග්‍රේන් දිශාව වැදගත් වන්නේ ඇයි?

ඇ) සිව් වර්ණ මුද්‍රණයකදී ඔබ තෝරා ගන්නේ කුමන ග්‍රේන් දිශාවද?

ඈ) ඉහත (ඇ) හි සඳහන් කල ග්‍රේන් දිශාව තෝරා ගැනීමට හේතු කවරේද?

02. පිටු 40 ක පොතක් මුද්‍රණයේදී පිටු 16, 08, 16 ආකාරයට ඇතුලත් (insert) කර මැදින් වයර් කිරීමට සකස් කර ඇත. මෙම මුද්‍රිත පොතෙහි දෙවන පත්‍රයෙහි (sheet) පිටු පිහිටා තිබෙන ආකාරය ඇඳ පිටු අංක නියමිත පිටුවේ ලකුණු කරන්න.

03. කඩදාසියක එක් වර්ණයක් මුද්‍රණය කර දෙවන වර්ණය මුද්‍රණය කරන විට එය කුමන ආකාරයකින් වත් එක මත එක මුද්‍රණය කළ නොහැකි විය. එනම් රෙජිස්ටර් (register) කළ නොහැකි විය. මෙසේ වීමට හේතු කවරේදැයි විස්තර සහිතව පහදා දෙන්න. මෙසේ කිසිම ආකාරයකට රෙජිස්ටර් කළ නොහැකි වන්නේ කඩදාසියේ කුමන දිශාවට සිදු වන වෙනස් කමක් නිසාද? එම වෙනස්කම ඇති වන්නේ කුමක් නිසාද යන්න විස්තර කරන්න.

04. ඉහත ප්‍රශ්න අංක 03 හි සඳහන් ගැටළුව විසඳා ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරියා විසින් තවත් කඩදාසි වර්ගයක් සපයන ලදී. එහිදී ද, රෙජිස්ටර් නොවුන අතර ඔහු විසින් යන්ත්‍රයේ යම් යම් වෙනස්කම් කීපයක් කිරීමෙන් පසුව රෙජිස්ටර් කිරීම හොඳින් සිදුකල හැකි විය. මෙහිදී සපයන ලද කඩදාසි සහ ඉහත ප්‍රශ්න අංක 03 හි සඳහන් කඩදාසි අතර ඇති වෙනස්කම කුමක්ද? අධීක්ෂණ නිලධාරියා විසින් යන්ත්‍රයේ කරන ලද වෙනස්කම් කවරේද?

(64)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් (ලිතෝ මුද්‍රණ ශිල්පීන්) II "අ" පන්තියේ සිට I පන්තියට උසස් කිරීමේ විභාගය - 2012

ලිතෝ මුද්‍රණ ශිල්පය II

2012.08.25 කාලය පැය තුන (03) යි 1300-1600 පැය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

01. අ) ලිතෝ මුද්‍රණ ශිල්පය පාදක කොට ඇත්තේ කුමක් පදනම් කොට ගෙන ද?

ආ) උත්තල මුද්‍රණ ශිල්පයේ සහ ලිතෝ මුද්‍රණ ශිල්පයේ විශේෂ වෙනස්කම් 03 ක් ලියන්න.

ඇ) ලිතෝ මුද්‍රණ ශිල්පය ඕෆ් සෙට් (offset) මුද්‍රණ ශිල්පය ලෙස හඳුන් වන විට ඇති වෙනස කුමක්ද?

ඈ) උත්තල මුද්‍රණ ශිල්පයෙන් සහ ලිතෝ මුද්‍රණ ශිල්පයෙන් මුද්‍රණය කරන ලද මුද්‍රිතයන් දෙකක් දී ඇති විට ඒවා කුමන ක්‍රමයෙන් මුද්‍රණය කළා දැයි හඳුණා ගන්නේ කෙසේද?

02. සාම්ප්‍රදායික ඕෆ් සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍රයක රූප සටහනක් ඇඳ එහි තිබිය යුතු අත්‍යාවශ්‍ය කොටස් ලකුණු කර පෙන්වන්න.

03. අ) ප්‍රොසෙස් තීන්ත සහ ඔපෙක් තීන්ත අතර වෙනස කුමක්ද?

ආ) ආලෝකයේ ඇති මූලික වර්ණ මොනවාද?

ඇ) මූලික ප්‍රොසෙස් තීන්ත වර්ණ මොනවාද?

ඈ) ප්‍රොසෙස් තීන්ත මතට ආලෝක කිරණ පතිත වූ විට එම කිරණ ගමන් කරන මාර්ගය රූප සටහන් ඇඳ පැහැදිලි කරන්න.

04. අ) පොසිටිව් සහ නෙගටිව් වශයෙන් ඇති මුද්‍රණ තහඩු වර්ග දෙක මතට ආලෝක කිරණ පතිත වූ විට මුද්‍රණ තහඩුවල ආලේපිතයන්ගේ භෞතික ගුණාංගවල සිදු වන වෙනස්කම් මොනවාද?

ආ) නෙගටිව් තහඩුවක් මත නෙගටිව් ඡායා පටලයක් බොහෝ වේලා ආලෝකයට නිරාවරණය කළ හොත් සිදුවන්නේ කුමක්ද?

000003

(66)

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් (ලිතෝ මුද්‍රණ ශිල්පීන්) II "අ" පන්තියේ සිට I පන්තියට උසස් කිරීමේ විභාගය - 2012

ලිතෝ මුද්‍රණ ශිල්පය (ප්‍රායෝගික)

2012.08.27 කාලය පැය හත (07) යි 0900-1200 පැය 1300-1600 පැය

ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

1. ග්‍රේන් දිශාව කොට අතට ඇති (short grain) සුදු මුද්‍රණ කඩදාසි 100 ක් දී ඇත. ඒවා භාවිතා කර සිවි වර්ණ මුද්‍රණයක් නිවැරදිව ලබා ගන්න. තනි වර්ණය, වර්ණ 2 , වර්ණ 3 සහ වර්ණ 4 ම මුද්‍රණය කළ කඩදාසි දෙක බැගින් ලබා ගන්න.

2. ග්‍රේන් දිශාව දිග අතට ඇති (long grain) සුදු මුද්‍රණ කඩදාසි 100 ක් දී ඇත. ඒවා භාවිතා කර සිවි වර්ණ මුද්‍රණයක් නිවැරදිව ලබා ගන්න. තනි වර්ණය, වර්ණ 2 , වර්ණ 3 සහ වර්ණ 4 ම මුද්‍රණය කළ කඩදාසි දෙක බැගින් ලබා ගන්න.